අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් කාර්යාලය
அத்தியாவசிய சேவைகள் ஆணையாளர் நாயகம் அலுவலகம்
OFFICE OF THE COMMISSIONER GENERAL OF ESSENTIAL SERVICES

**2025-දෙසැම්බර්-06 : ප.ව.08.30**
ගොනු අංකය : **2025/02**

# මාධ්‍ය නිවේදනය

රට පුරා අත්‍යවශ්‍ය සේවා ලබා ගැනීමේදී ඇතිවන පැමිණිලි සහ දුෂ්කරතා කඩිනමින් වාර්තා කිරීම පහසු කිරීම සඳහා **1904** යන ක්ෂණික ඇමතුම් අංකය, අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් කාර්යාලය විසින් නිල වශයෙන් හඳුන්වා දී ඇති බව මෙයින් මහජනතාවට දැනුම් දෙමි.

පහත සඳහන් කරුණු සම්බන්ධ ගැටලු වාර්තා කිරීමට **1904** ක්ෂණික ඇමතුම් අංකය භාවිතා කළ හැකිය :

- විදුලි සැපයුම
- ඉන්ධන බෙදාහැරීම
- රෝහල් සහ හදිසි වෛද්‍ය සේවා
- මහජන ප්‍රවාහනය සහ සැපයුම්
- ජල සැපයුම සහ සනීපාරක්ෂාව
- ආහාර සහ අත්‍යවශ්‍ය භාණ්ඩ
- විදුලි සංදේශ සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) සේවා
- අති විශේෂ ගැසට් පත්‍ර අංක 2464/29 යටතේ ප්‍රකාශයට පත් කරන ලද වාරිමාර්ග සහ අනෙකුත් අත්‍යවශ්‍ය මහජන සේවා

හදිසි අවස්ථා හෝ සේවා බිඳ වැටීමකදී මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි සඳහා නියමිත වේලාවට ප්‍රතිචාර දැක්වීම, වඩා හොඳ සම්බන්ධීකරණයක් සහ කාර්යක්ෂම විසඳුමක් සහතික කිරීම සඳහා මෙම වැඩපිළිවෙල හඳුන්වා දී ඇත.

1904 වෙත ලැබෙන සියලුම ඇමතුම් අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් කාර්යාලයේ මෙහෙයුම් මධ්‍යස්ථානය මගින් භාරගනු ලබන අතර, එහිදී පැමිණිලි පරීක්ෂා කර, ප්‍රමුඛතාවය ලබා දී, කඩිනම් ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ අංශයන්හි ක්‍රියාත්මක කණ්ඩායම් වෙත යොමු කරනු ලැබේ.

කඩිනම් විසඳුම් සඳහා පහසුකම් සැලසීම පිණිස, මෙම ක්ෂණික ඇමතුම් අංකය වගකීමෙන් යුතුව භාවිතා කරන ලෙසත්, නිවැරදි තොරතුරු ලබා දෙන ලෙසත්, සියලුම පුරවැසියන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති
අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්

ඊමේල් ලිපිනය மின்னஞ்சல் **Email Address: cg@ocges.gov.lk**

අංක 150, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව
எண். 150, ஆர்.ஏ. டி மல் மாவத்தை, கொழும்பு 03, இலங்கை
No. 150, R.A. De Mal Mawatha, Colombo 03, Sri Lanka